# ප්‍රසම්පාදන දැන්වීමයි

ජනමාධ්‍ය අමාත්‍යාංශය

2024 වර්ෂය සඳහා ආරක්ෂක සේවා සැපයීමට මිල ගණන් කැඳවීම

01. ජනමාධ්‍ය අමාත්‍යාංශය පිහිටි පරිශ්‍රයට ආරක්ෂක සේවා සැපයීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇති ආයතන වලින් මිල ගණන් කැඳවනු ලැබේ.

02. මිල ගණන් ඉදිරිපත් කළ යුත්තේ අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍ර වල පමණකි. ප්‍රසම්පාදන ලියවිලි ඉල්ලුම් කරන ආයතන 2024 වර්ෂය සඳහා ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇති සහ ආරක්ෂක කටයුතු සැපයීම පිළිබඳව අවම වශයෙන් අවුරුදු තුනක පළපුරුද්දක් ඇති ආයතන විය යුතු වේ. ආපසු නොගෙවනු ලබන රු. 1000/= ක ගාස්තුවක් අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවා ලබා ගත් රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් පසු සාමාන්‍ය කාර්යාල දිනයන්හි දී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ගිණුම් අංශයෙන් ප්‍රසම්පාදන ලියවිලි ලබා ගත හැක.

03. ප්‍රසම්පාදන ලියවිලි 2024.03.04 වන දින ප.ව. 3.00 දක්වා නිකුත් කරනු ලැබේ.

04. නිසි පරිදි සකස් කරන ලද ප්‍රසම්පාදන ලියවිලි මුද්‍රා තබා 2024.03.05 වන දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ,

    සභාපති
    ප්‍රසම්පාදන කමිටුව
    ජනමාධ්‍ය අමාත්‍යාංශය
    ඇසිදිසි මැදුර
    නො. 163, කිරුළපන මාවත
    පොල්හේන්ගොඩ
    කොළඹ 05

    යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකිය. එසේ නැතිනම් අතින් රැගෙන විත් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. නියමිත වේලාවට පසුව ලැබෙන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ලංසු බාර ගැනීම 2024.03.05 වන දින ප.ව. 2.00 ට අවසන් කරන අතර අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

06. ප්‍රසම්පාදන ලියවිලි ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ගිණුම් අංශයේ දී නොමිලේ පරීක්ෂා කළ හැකිය.

07. වැඩි විස්තර සඳහා දුරකථන අංක 011-2513464 මගින් ප්‍රධාන ගණකාධිකාරී ඇමතීමෙන් ලබා ගත හැක.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
ජනමාධ්‍ය අමාත්‍යාංශය